# ව්‍යාපාර අධ්‍යයනය
## ආචාර්ය සුගත් මංජුල අමරසේන

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය
## I කොටස

කාලය : පැය 02 යි.

උපදෙස් :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**
- **අංක 31 සිට 40 දක්වා නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න**
- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.**

(1) නවීන තාක්‍ෂණික යන්ත්‍ර සූත්‍ර යොදා ධීවර නිෂ්පාදනයේ ඵලදායීතාවය වැඩි කළ හැකිය. එවැනි යන්ත්‍ර සූත්‍ර නිපදවීම අයත් වන්නේ,

(1) ප්‍රාථමික හෝ කෘෂිකාර්මික අංශයටය. (2) ද්විතීයික හෝ සේවා අංශයටය.
(3) ප්‍රාථමික හෝ කාර්මික අංශයටය. (4) ද්විතීයික හෝ කාර්මික අංශයටය.
(5) තෘතීයික හෝ සේවා අංශටය.

(2) වර්තමානයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා වෙළෙඳ පොළෙන් සපුරා ගැනීමට හැකි වී ඇත්තේ,

(1) භාණ්ඩ හුවමාරු ක්‍රමය නිසාය. (2) ඍජු නිෂ්පාදන නිසාය.
(3) වෙළඳාම නිසාය. (4) වක්‍ර නිෂ්පාදනය නිසාය.
(5) මුදල් හුවමාරු ක්‍රමය නිසාය.

(3) ව්‍යාපාර යන්න හැඳින්වීමට අදාළ අර්ථකතන පහත දැක්වේ.

A. පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කිරීම උදෙසා නිෂ්පාදිත නිර්මාණය කරනු ලබන ලාභ අපේක්ෂිත කටයුතුය.
B. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය සියලු වාණිජ කටයුතුය.
C. ලාභ අපේක්ෂාවන් පවත්වාගෙන යන පාරිභෝගික අවශ්‍යතා සපුරාලන ආර්ථික කටයුතුය.
D. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා වූ ඕනෑම කටයුත්තකි.
E. ලාභ අපේක්ෂිත හෝ අනපේක්ෂිත මිනිස් අවශ්‍යතා වුවමනා ඉටු කිරීම සඳහා වූ ඕනෑම ආර්ථික හෝ ආර්ථික නොවන කටයුතුය.

ඉහත අර්ථකථන අතුරින් පටු නිර්වචන පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) A, B, D, E (2) B, C, D (3) A, B, C (4) A, C, D, E (5) A, D, E

(4) ව්‍යාපාරයක පැවැත්ම තහවුරු කරන ආසන්නතම පරිසර සාධකයක් වන්නේ,

(1) අයිතිකරු ය. (2) තරඟකරු ය.
(3) විභව ආයෝජකයෝ ය. (4) ගනුදෙනුකරු ය.
(5) සැපයුම්කරු ය.

(5) ආචාර ධර්ම පද්ධතිකයක් ගොඩනැගීමේදී සැලකිලිමත් නොවන කරුණක් වන්නේ,

(1) ව්‍යාපාරය (2) ගණුදෙනුකරුවන් (3) කළමනාකරුවන්

(4) සේවකයින් (5) සමාජ සංස්කෘතිය

(6) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය යන්නට වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

(1) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සුරැකුම්පත් ඇපයට තබා අරමුදල් ලබා ගැනීමේදී අය කරන පොලී අනුපාතයයි.

(2) වාණිජ බැංකු රජයේ සුරැකුම්පත් ඇපයට තබා අරමුදල් ලබා ගැනීමේදී අය කරන පොලී අනුපාතයයි.

(3) අවසාන ණය දෙන්නා වශයෙන් මහ බැංකුව වාණිජ බැංකුවලින් අයකරන පොලී අනුපාතයයි.

(4) වාණිජ බැංකු රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතයයි.

(5) වාණිජ බැංකුවල තැන්පතු වලට අදාළව මහ බැංකුවේ පවත්වාගත යුතු සංචිත අනුපාතයයි.

(7) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ව්‍යාපාරවල වගකීම ලෙස ප්‍රමුඛත්වය ලබා දී ඇති පරිසර ක්ෂේත්‍ර හතර වන්නේ,

(1) පරිසරය/ මානව අයිතීන්/පාරිභෝගික අයිතීන්/සේවක අයිතීන්

(2) මානව අයිතීන්/ආයෝජන අයිතීන්/ සේවක අයිතීන්/ප්‍රජා සේවය

(3) මානව අයිතීන්/සේවක අයිතීන්/පරිසර ආරක්ෂාව/ප්‍රජා සේවය

(4) ප්‍රජා සේවය/පරිසර අයිතිය /පාරිභෝගික අයිතිය/ ආයෝජන අයිතිය

(5) ආයෝජන අයිතීන්/මානව අයිතීන්/සේවක අයිතීන්/පාරිභෝගික අයිතීන්

(8) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරයට අයත් බලවේග කිහිපයකි.

(A) සැපයුම්කරුවන් (D) තරඟකරුවන් (G) විභව ව්‍යාපාරිකයින්

(B) අයිතිකරුවන් (E) තාක්ෂණය (H) කළමනාකරුවන්

(C) සේවකයින් (F) සංවිධාන ව්‍යුහය

මේ අතුරින් ව්‍යාපාරයට අවස්ථා හෝ තර්ජන ඇතිකරන බලවේග පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) A D G H (2) A D E G (3) B C F H (4) D E G H (5) A C E G

(9) ආහාර පනත යටතේ පැමිණිලි ඉදිරිපත් කළ හැකි පාර්ශවයක් වන්නේ,

(1) පොලිස් ස්ථානාධිපති (2) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (3) ආහාර අධ්‍යක්ෂ

(4) සෞඛ්‍ය ඇමති (5) ආහාර නියාමන අධ්‍යක්ෂ

(10) පුද්ගලයින් දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් සිටීම, ලියාපදිංචිය අනිවාර්ය නොවීම, කෙටිකාලීන තාවකාලික අරමුණක් පැවතීම.

(1) හවුල් ව්‍යාපාරවල ලක්‍ෂණයකි. (2) බද්ධ ව්‍යාපාරවල ලක්‍ෂණයකි.
(3) පෞද්ගලික සමාගම්වල ලක්ෂණයකි. (4) වරලත් සමාගම්වල ලක්ෂණයකි.
(5) බද්ධ සමාගම්වල ලක්ෂණයකි.

(11) සමාගමක් සංස්ථාගත කිරීමට අදාළව ලත් වූ සියළු නියමයන්ට අනුව ක්‍රියාකර ඇති බවට සාක්ෂියක් වන ලියවිල්ල වන්නේ,

(1) වාර්ෂික සමාගම් වාර්තාව. (2) සංස්ථා ප්‍රකාශය.
(3) සාංගමික සංස්ථා පත්‍රය. (4) සාංගමික ව්‍යවස්ථාවලිය.
(5) සංස්ථාපන සහතිකය.

(12) අන්තර්ජාලය ඔස්සේ බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිතා කරමින් ස්වයංක්‍රීයව බැංකු පහසුකම් ලබාගැනීමේ ක්‍රමය වන්නේ,

(1) ණයපත් සේවාව. (2) අන්තර් බැංකුකරණය. (3) ඒකීය බැංකුකරණය.
(4) විද්‍යුත් බැංකුකරණය. (5) මාස්ටර් කාඩ්.

(13) ආසන්න මුදල්වලට අයත් නොවන්නේ මින් කුමක් ද?

(1) භාණ්ඩාගාර බිල්පත් (2) වාණිජ පත්‍රිකා (3) විනිමය බිල්පත්
(4) චෙක්පත් (5) බැංකුවල මහජනයා සතු කාලින හා ඉතුරුම් තැන්පතු ශේෂ

(14) පහත දැක්වෙන්නේ ස්වයංක්‍රීය බැංකු සේවා වලින් ඇති ප්‍රයෝජන කිහිපයකි.

(A) තදබදය අඩු වීම. (B) පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම.
(C) නිවැරදිතාව ඉහළ වීම. (D) කාර්ය මණ්ඩලය අඩු වීම.
(E) ගිණුමේ තොරතුරු ලබාගත හැකි වීම.

(15) 2016 ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තාවට අනුව උපුටා ගත් ශ්‍රී ලංකාවේ මූල්‍යාතන වර්ගීකරණයක් පහත දැක්වේ.

| X | Y |
|---|---|
| A. බැංකු අංශය<br>B. තැන්පතු භාරගන්නා අනෙකුත් මුල්‍යාතන<br>C. විශේෂිත මූල්‍යාතන<br>D. ගිවිසුම් ඉතුරුම් ආයතන | (1) බලපත්‍ර ලාභී මුදල් සමාගම්<br>(2) කොටස් තැරැව්කරුවන්<br>(3) බලපත්‍ර ලාභී වාණිජ බැංකු<br>(4) ඒකකභාර කළමනාකරණ සමාගම්<br>(5) රක්ෂණ සමාගම්<br>(6) මහා බැංකුව<br>(7) සේවක අර්ථ සාධක අරමුදල<br>(8) සමූපකාර ග්‍රාමීය බැංකු |

X හා Y ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A – 3, 6 B – 2, 4 C – 5, 7 D – 1, 8

(2) A – 1, 8 B – 3, 6 C – 2, 4 D – 5, 7

(3) A – 3, 6 B – 1, 8 C – 2, 4 D – 5, 7

(4) A – 2, 4 B – 1, 8 C – 5, 7 D – 3, 6

(5) A – 3, 6 B – 5, 7 C – 2, 4 D – 1, 8

(16) වෛද්‍යවරයකු ඔහු අතින් සිදුවිය හැකි කිසියම් අත්වැරදීමක්, ප්‍රමාද දෝෂයක් නිසා ඇතිවිය හැකි හානි ආවරණය කර ගැනීමට ලබාගත යුතු රක්ෂණය වන්නේ,

(1) දේපල අයිතිකරුවන්ගේ වගකීම් රක්ෂණය (2) මහජන වගකීම් රක්ෂණය

(3) වෘත්තීය වගකීම් රක්ෂණය (4) ජීවිත රක්ෂණය

(5) පරිත්‍යාග රක්ෂණය

(17) ආයතනයක සේවකයකුගේ අවමංගල්‍යයක් ආයතනයේ අනෙකුත් අයට දැනුම් දීමට සුදුසුම සන්නිවේදන ක්‍රමය කුමක්ද?

(1) ඉන්ටකොම් (2) වාර්තාවක් සැකසීම (3) දැන්වීම් පුවරුව

(4) චක්‍රලේඛ මගින් (5) අත්පත්‍රිකා මගින්

(18) පහත දැක්වෙන්නේ සන්නිවේදනය සම්බන්ධ තොරතුරු කිහිපයකි.

| X | Y |
|---|---|
| A. ජන සන්නිවේදනය | 1. තොරතුරු ගවේශණයට යොදා ගනී. |
| B. එක්ස්ට්‍රානෙට් | 2. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට යොදා ගනී. |
| C. අන්තර්ජාලය | 3. තෝරාගත් පිටස්තර අයට තොරතුරු ලබා දේ. |
| D. ඉන්ට්‍රානෙට් | 4. පුළුල් පරසරයක් ආවරණය කෙරෙන පරිගණක ජාලයකි. |
| E. අල්ටා විස්ටා | 5. ආයතන තුළ ඇති දත්ත වලට ළඟා වීමට යොදා ගනී. |

X හා Y ගලපූ විට නිවැරදි පිළිතුරු කුමක්ද?

(1) A-2, B-3, C-4, D-5, E-1

(2) A-5, B-4, C-3, D-2, E-1

(3) A-3, B-2, C-4, D-1, E-5

(4) A-4, B-1, C-2, D-3, E-5

(5) A-1, B-2, C-3, D-4, E-5

(19) ශ්‍රී ලංකාවේ ආනයන වටිනාකම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කරන ප්‍රධානම මූලාශ්‍ර ලියවිල්ල වන්නේ,

(1) ආනයන බලපත්‍රය. (2) වෙළඳ ඉන්වොයිසිය (3) ආනයන සටහන්කරය

(4) ණයවර ලිපිය (5) ගුදම් බලපත්‍රය

(20) නම්‍යශීලී ප්‍රවාහන ක්‍රමයක් වන්නේ,

(1) ගුවන් ප්‍රවාහනයයි. (2) මහාමාර්ග ප්‍රවාහනයයි. (3) දුම්රිය ප්‍රවාහනයයි.
(4) ජල ප්‍රවාහනයයි. (5) නල ප්‍රවාහනයයි.

(21) විදේශ වෙළඳාමට එරෙහි බාධා අවම කර, එහි උන්නතිය වෙනුවෙන් පිහිටුවා ඇති ජාත්‍යන්තර සංවිධාන ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) යුරෝපීය සංගමය, ආසියානු සංවිධානය, සාර්ක් සංවිධානය, ඔපෙක් සංවිධානය.
(2) ලෝක වෙළඳ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, රටවල් අටේ කණ්ඩායම.
(3) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, යුරෝපා සංගමය, ඔපෙක් සංවිධානය, ලෝක බැංකුව.
(4) ලෝක බැංකුව, ආසියානු සංවිධානය, ඔපෙක් සංවිධානය, යුරෝපා සංගමය.
(5) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, යුරෝපා සංවිධානය, ආසියානු සංවිධානය.

(22) පහත සඳහන් වන්නේ කළමනාකරුවෙකු, කළමනාකරන කාර්යයට අදාළව ඉටු කරණු ලබන විවිධ ක්‍රියාකාරකම්ය.

A. ගිවිසුම් වලට අත්සන් කිරීම.
B. මාධ්‍ය සමඟ සම්මුඛ සාකච්ඡා.
C. සේවක වැඩ වර්ජන වලට ප්‍රතික්‍රියා දැක්වීම.
E. සේවකයන් උසස් කිරීම.
F. සංවිධානයේ තොරතුරු සෙවීම.
G. කාර්මික සබඳතා.

(23) පහත වගුවේ X තීරුවේ කළමනාකරණ මට්ටම් තුනක් ද, Y තීරුවේ ඒ හා සම්බන්ධ කළමනාකරුවන් ලැයිස්තුවක්ද දැක්වේ.

| X | Y |
|---|---|
| (A) අග්‍ර කළමනාකරු | (1) සුපරීක්ෂක |
| (B) මධ්‍ය කළමනාකරු | (2) මූල්‍ය කළමනාකරු |
| (C) පහළ කළමනාකරු | (3) මානව සම්පත් කළමනාකරු |
| | (4) වැඩ මූලික කළමනාකරු |
| | (5) ප්‍රධාන විධායක කළමනාකරු |
| | (6) සාමාන්‍යාධිකාරී |

X හා Y තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-3, C- 5,6 (2) A-5, B-3, C- 1,2 (3) A-3, B-2, C- 1,4
(4) A-5,6 B-2, 3 C-1,4 (5) A-4, 6 B-2,5 C-1,3

(24) පහත දැක්වෙන පිරියත සැලසුම් ලක්ෂණ අතුරින් ස්ථාවර ස්ථානීය පිරියත සැලසුමට අදාළ නොවන ලක්ෂණය තෝරන්න.

(1) නිෂ්පාදනය නිමවූ පසු නිෂ්පාදිතය ඉවත් කර ගනී.
(2) නිෂ්පාදන කටයුතු එකම ස්ථානයක සිදු කරයි.
(3) ප්‍රමාණයෙන් විශාල නිෂ්පාදිත නිෂ්පාදනයට යොදාගනී.
(4) සේවකයින් ඒ ඒ කාර්යයන් අතර පහසුවෙන් මාරු කල හැක.
(5) නිෂ්පාදන කටයුතු නිමවූ පසු නිෂ්පාදිතය ස්ථාවරව තබාගනී.

(25) භාණ්ඩයක නිෂ්පාදිත මට්ටම හා ඒවාට අදාළ නිදසුන් පහත දැක්වේ.

| නිෂ්පාදිත මට්ටම | නිදසුන් |
|---|---|
| (A) හර ප්‍රතිලාභ | (1) ආයාසයකින් තොරව ලිවීම. |
| (B) මූලික නිෂ්පාදිතය | (2) ලිවීමට පහසුව ලබාදීම. |
| (C) අපේක්ෂිත නිෂ්පාදිතය | (3) පෑනෙන් වේලාව බැලීම. |
| (D) වැඩිදියුණු කළ නිෂ්පාදිතය | (4) පෑනෙන් ලිවීම. |
| (E) විභව නිෂ්පාදිතය | (5) පෑනට හැඩයක් ගෙනදීම. |

නිෂ්පාදිත මට්ටම් හා නිදිසුන් නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) A-5, B-4, C-3, D-2, E-1
(2) A-2, B-3, C-4, D-5, E-1
(3) A-4, B-2, C-3, D-1, E-5
(4) A-4, B-1, C-2, D-3, E-5
(5) A-4, B-2, C-5, D-3, E-1

(26) මූල්‍ය කළමනාකරණ තීරණ හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

(A) ව්‍යාපාර නවීකරණය සඳහා දරණ පිරිවැය දිගුකාලීන ආයෝජනයකි.
(B) සාංගමික බැඳුම්කර නිකුත් කිරීම කෙටි කාලීන මූල්‍යයනයකි.
(C) ණයගැතියන් හා සම්බන්ධ තීරණ ගැනීම කෙටිකාලීන ආයෝජනයකි.
(D) ගෙවීම් ප්‍රමාද කිරීම දිගුකාලීන ආයෝජන තීරණයකි.

(27) දිගු කාලීන අරමුදල් අවශ්‍ය පාර්ශවයන් තම අරමුදල් අවශ්‍යතා සපුරා ගන්නා වෙළඳපොළ හඳුන්වනුයේ,

(1) මූල්‍ය වෙළඳපොළ ලෙසය.
(2) මුදල් වෙළඳපොල ලෙසය.
(3) ප්‍රාග්ධන වෙළඳපොල ලෙසය.
(4) ද්විතීයික වෙළඳපොල ලෙසය.
(5) ප්‍රාථමික වෙළඳපොල ලෙසය.

(28) ව්‍යාපාරයක මූල්‍ය වාර්තා ආශ්‍රයෙන් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

2015-01-01 තොගය = 20,000 ගැනුම් = 210,000

2015-12-31 තොගය = 30,000 ණය ගැතියෝ = 20,000

විකුණුම් පිරිවැය = 200,000 මුදල් ශේෂය = 20,000

ව්‍යාපාරයේ තොග පිරිවැටුම් අනුපාතය වන්නේ,

(1) වාර 08 (2) වාර 10 (3) වාර 06 (4) වාර 2.5 (5) වාර 4

(29) සේවක කාර්ය ඵල ඇගැයීමේ පරිපාලනමය අරමුණක් වන්නේ,

(1) සේවක පුහුණුව ලබා දීම.

(2) සේවක ඵලදායිතාවය ඉහළ දැමීම.

(3) සේවක සංවර්ධනය සඳහා තොරතුරු ලබාගැනීම.

(4) තීරණ ගැනීමේ කුසලතා වැඩි දියුණු කිරීම.

(5) සේවක උසස් වීම් ලබා දීම.

(30) ව්‍යාපාර සැලැස්මේ අන්තර්ගතයන් හා ඊට අදාළ පැහැදිලි කිරීම් කිහිපයක් පහත දැක්වේ.

| අන්තර්ගතයන් | පැහැදිලි කිරීම් |
|---|---|
| (A) විධායක සාරාංශය | (1) ගනුදෙනුකරුවන්ට ලැබෙන සුවිශේෂ ප්‍රතිලාභ |
| (B) ව්‍යාපාර විස්තරය | (2) තරගකරුවන්ගේ උපක්‍රම |
| (C) අලෙවි සැලැස්ම | (3) පාරිසරික බලපෑම |
| (D) මෙහෙයුම් සැලැස්ම | (4) සැලැස්ම පිළිබඳ මඟ පෙන්වීමක් ලබාදීම |
| (E) මානව සම්පත් සැලැස්ම | (5) සංවිධාන ව්‍යුහය හා සටහන |

ව්‍යාපාර සැලැස්මේ අන්තර්ගතයන් හා පැහැදිලි කිරීම් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-2, C-3, D-4, E-5

(2) A-2, B-3, C-4, D-5, E-1

(3) A-4, B-1, C-2, D-3, E-5

(4) A-3, B-4, C-5, D-1, E-2

(5) A-4, B-5, C-1, D-2, E-3

- **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(31) (අ) ව්‍යාපාරයක ආරම්භයට හා පැවැත්මට අවශ්‍ය අභ්‍යන්තර පාර්ශවය ............................................ වන අතර ව්‍යාපාරයේ පැවැත්මට අදාළ බාහිර පාර්ශවයක් වන්නේ ............................................

(ආ) ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක්කේ ........................................... පරිසර අධ්‍යයනය කිරීමෙන් වන අතර ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන් .................. ......................... හා ............................................ හඳුනාගත හැකිය.

(32) (අ) රාජ්‍ය වියදම් ........................................... හා ........................................... ලෙස වර්ග කරන අතර රාජ්‍ය ආදායම් ........................................... හා ........................................... ලෙස වර්ග කෙරේ.

(ආ) අභ්‍යන්තර පරිසර විශ්ලේෂණයේදී සඵලදායී/ සාර්ථක නායකත්වය ව්‍යාපාරයක ........................................... වන අතර දක්ෂ සේවකයන් නොසිටීම ව්‍යාපාරයක ........................................... කි.

(33) (අ) වගකීම සීමිත, නීතිමය පුද්ගලභාවය සහිත පෞද්ගලික අංශයට අයත්, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක් ........................................... ලෙස හැඳින්වෙන අතර නීතිමය පුද්ගලභාවය සහිත ලාභ ලැබීම අරමුණු වූ රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලෙස ........................................... සැළකිය හැකිය.

(ආ) කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු ව්‍යාපාර සංවිධාන ........................................... ලෙස හැඳින්වේ.

(34) (අ) පාරිභෝගික අධ්‍යාපනය ලබාගැනීම ........................................... ලෙසත්, සමාජය ගැන සැලකිලිමත් වීම ........................................... ලෙසත් පාරිභෝගික ජාත්‍යන්තරය පෙන්වා දී ඇත.

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඖෂධ සඳහා අනිවාර්ය කර ඇති ප්‍රමිතිය ........................................... වන අතර එය පිරිනමනු ලබන්නේ ........................................... සඳහාය.

(35) (අ) වරලත් සමාගම් වෙළඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට අවසර දෙන වරලත් සමාගම ........................................... ලෙස හඳුන්වන අතර වරළත් සමාගමින් අවසර ලබාගත් ආයතනය ........................................... ලෙස හැඳින්වේ.

(36) (අ) රැකියාව හා අධ්‍යාපනය ව්‍යවසායකත්ව ක්‍රියාවලියට බලපෑම් කරන ........................................... සාධකයක් ලෙසත් ආරම්භක හැකියාව හා අවස්ථා ක්‍රියාවට නැංවීම ව්‍යවසායකත්ව ........................................... ලෙසත් දැක්විය හැක.

(ආ) කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමේ නිර්නායකයක් ලෙස සේවක සංඛ්‍යාව භාවිතා කරන රාජ්‍ය ආයතන ........................................... වන අතර එහිදී සේවක සංඛ්‍යාව ...........................................අඩු ව්‍යාපාර කුඩා ව්‍යාපාර ලෙස සලකයි.

(37) (අ) බදු සහන සැලසීම කුඩා ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති ........................................... පෙළඹවීමක් වන අතර යටිතල පහසුකම් සැලසීම ........................................... පෙළඹවීමකි.

(ආ) ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණික ආයතනය කුඩා ව්‍යාපාරිකයන්ට ........................................... පහසුකම් ලබා දෙන අතර මහවැලි සංවර්ධන අධිකාරිය ........................................... පහසුකම් ලබා දේ.

(38) (අ) රොබට් එල්. කාට්ස් අනුව සෑම කළමනාකරුවෙකුම ප්‍රගුණ කළ යුතු පොදු කුසලතාවය .................................................................................... වන අතර ආයතනයක වැඩ කටයුතු සිදුවන අතරතුර විචල්‍යයන් වැළැක්වීමට යොදා ගන්නා ක්‍රියාමාර්ග ............................................ ............................................ වේ.

(ආ) භාණ්ඩ සේවා නිෂ්පාදනය සඳහා ආයතනයක් විසින් පරිවර්තන ක්‍රියාවලිය ගොඩ නගා ඇති ආකාරය ............................................ ලෙස හඳුන්වන අතර, නිෂ්පාදන ක්‍රියාවලියේ දී මිලදී ගන්නා දෑ ............................................ හා ............................................ ලෙස වෙන් කල හැක.

(39) (අ) රැකියා ප්‍රසිද්ධ කිරීම හා අනුප්‍රාප්තික සැලසුම් මගින් සේවකයින් අද්දවා ගැනීම ........................ ............................................ ක්‍රමයක් වන අතර රැකියාවට තෝරා ගැනීමේදී රැකියා අපේක්ෂකයාගේ විවිධ තත්වයන් පරීක්ෂා කිරීමට යොදා ගන්නා ක්‍රම ........................................ ............................................ ලෙස හඳුන්වනු ලබයි.

(ආ) අනුෂ්ඨාපනය හා කාර්යාල එල ඇගයීම ............................................................................ යොදා ගන්නා ක්‍රියාමාර්ග වන අතර, උසස් කිරීම් හා මාරු කිරීම් ............................................ සඳහා යොදා ගනී.

(40) (අ) නිශ්පාදන, නිශ්පාදිත හා විකුණුම් යන අලෙවිකරන සංකල්ප වල ප්‍රධානතම දුර්වලතාවය වූයේ ............................................................................................................................ යි.

(ආ) නිෂ්පාදිතයක ජීවන චක්‍රය සිදුවන කාල පරාසය තුළ විකුණුම් ඉතා සෙමින් හා ලාභ ක්‍රමයෙන් අඩුවන අදියර වන්නේ, ........................................................................................ යි.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්ණ වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) (අ) කළමනාකරුවකු ප්‍රගුණ කළ යුතු කුසලතා ඉදිරිපත් කරන ලද්දේ ............................................ වන අතර විද්‍යාත්මක කළමනාකරණයේ පියා ලෙස ............................................ හඳුන්වයි.

(ආ) භාණ්ඩ ඇණවුම් කළ අවස්ථාවේ සිට ඒවා ගබඩාවට ලැබෙන තෙක් කාලය .......................... ................. ලෙස හැඳින්වේ.

(42) චෙක්පත් රේඛනය කළ හැකි පාර්ශවයන් හතරක් දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(43) ආනයන ක්‍රියාපටි පාටියට අදාළ ප්‍රථම පියවර හතර දක්වන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................

3. ....................................................................................................................................................

4. ....................................................................................................................................................

(44)සැලසුම් සකස් කිරීමේ අනුගමනය කලයුතු මූලධර්ම හතරක් ලියන්න.

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

3. ....................................................................................................................................................

4. ....................................................................................................................................................

(45)මධ්‍යගතකරණයේ හා විමධ්‍යගතකරණයේ වාසි දෙක බැගින් ලියන්න.

1. .................................................................... 1. ....................................................................

2. .................................................................... 2. ....................................................................

(46)ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීමේ ප්‍රයෝජණ මොනවාද?

1. .................................................................... 2. ....................................................................

3. .................................................................... 4. ....................................................................

(47)නිෂ්පාදනයක ජීවන චක්‍රයට අදාළ අදියර හා ලක්ෂණ කිහිපයක් වගුවේ දක්වා ඇත. හිස්තැනට අදාළ පිළිතුර ලියන්න.

| ලක්ෂණය | වර්ධන අදියර | පරිනත අදියර |
|---|---|---|
| 1. පිරිවැය | | |
| 2. විකුණුම් | | |
| 3. ලාභ | | |
| 4. අලෙවි ප්‍රවර්ධනය | | |

(48)භාණ්ඩයකට ඇසුරුමක් නිර්මාණය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු මොනවාද?

1. .................................................................... 2. ....................................................................

3. .................................................................... 4. ....................................................................

(49)ලාභදායිත්ව අනුපාත වර්ග හතරක් ලියන්න.

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

3. ....................................................................................................................................................

4. ....................................................................................................................................................

(50)මිනිස් බල සැලසුමක අඩංගු කරුණු මොනවාද?

1. .................................................................... 2. ....................................................................

3. .................................................................... 4. ....................................................................

**ව්‍යාපාර අධ්‍යයනය**
**ආචාර්ය සුගත් මංජුල අමරසේන**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018**
**ආදර්ශ ප්‍රශ්න පත්‍රය II කොටස**

කාලය : පැය 03 යි.

- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න**

## ‘අ’ කොටස

(1) (i) (අ) ව්‍යාපාර විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා සිය ව්‍යාපාර කටයුතු මෙහෙයවයි. එවැනි අරමුණු 4 ක් දක්වන්න.
(ආ) නූතන ව්‍යාපාරික ලෝකයේ ඔබ දකින ප්‍රවණතා මොනවාද?

(ii) (අ) ‘ගැනුම්කරුවන්, විකුණුම්කරුවන් හමුවන ඕනෑම ස්ථානයක් වෙළඳපලකි’ මෙම ප්‍රකාශය පහදන්න.
(ආ) ‘ව්‍යාපාර වලට අවශ්‍ය වන්නේ අවශ්‍යතා නොව, වුවමනායි’ ඉහත ප්‍රකාශයට ඔබ එකඟවේද? අදහස් දක්වන්න.

(iii) (අ) ව්‍යාපාරයක පැවැත්ම තහවුරු කිරීම සඳහා ගනුදෙනුකරුවන් හා ආයෝජකයන්ගෙන් ලැබෙන දායකත්වය දක්වන්න.
(ආ) තාක්ෂණික පරිසරයට ව්‍යාපාර වලට බලපෑම් කරන්නේ කෙසේද? අදහස් දක්වන්න.

(iv) (අ) ව්‍යාපාර, සමාජ වගකීම් ඉටුකිරීමට මෙතරම් උනන්දු වන්නේ ඇයි දැයි දක්වන්න.
(ආ) ව්‍යාපාරයක සේවකයන් හා සේව්‍ය පක්ෂ විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම 2 බැගින් දක්වන්න.

(v) (අ) රටක ආර්ථික ස්ථායිතාව ඇති කිරීමට රජය කටයුතු කරන්නේ කෙසේදැයි දක්වන්න.
(ආ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රටේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ආකාර 4 දක්වන්න.

(2) (i) (අ) පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීමට ව්‍යාපාරික ප්‍රජාවට දායක විය හැකි ආකාර 4 ක් දක්වන්න.
(ආ) ප්‍රමිති ක්‍රියාත්මක වීමෙන් රටකට ලැබෙන ප්‍රතිලාභ 4 ක් දක්වන්න.

(ii) (අ) හවුලකට ඇති ශක්තීන් මොනවාදැයි දක්වන්න.
(ආ) සීමාසහිත පොදු සමාගම් වැඩිවීම තුළින් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ දක්වන්න.

(iii) (අ) වරලත් ව්‍යාපාර ජනප්‍රියවීමට බලපා ඇති හේතූන් 4 ක් දක්වන්න.
(ආ) අක්වෙරළ සමාගම් හා විදේශ සමාගම් අතර ඇති සමානකම් හා අසමානකම් 2 බැගින් දක්වන්න.

(iv) (අ) ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන මෙහෙයවන ව්‍යාපාර වෙන වෙනම දක්වන්න.
(ආ) ව්‍යවසායකයින් බිහිවීමට බලපෑ සාධක 04 ක් දක්වන්න.

(v) (අ) සමාජීය ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකු අපේක්ෂා කරන ප්‍රතිලාභ 02 ක් දක්වන්න.

(ආ) කුඩා ව්‍යාපාර දිරිගැන්වීම සඳහා රජයකට ලබාදිය හැකි දිරිගැන්වීම් ක්‍රම 4 ක් දක්වන්න.

(3) (i) (අ) ව්‍යාපාර විකාශනයේ යුග 4 ක් දක්වන්න.

(ආ) ව්‍යවහාර මුදල් වලට සාපේක්ෂව, විද්‍යුත් මුදල් ජනප්‍රිය වීමට හේතු 4 ක් දක්වන්න.

(ii) (අ) චෙක්පතක් පිටසන් කරන අවස්ථා 2 ක් දක්වන්න.

(ආ) ව්‍යාපාරික උපදෙස් දීමට අමතරව ව්‍යාපාරික බැංකුවක්, තම ගනුදෙනුකරුවන්ට සපයන සේවා 2 ක් දක්වන්න.

(iii) (අ) පිළිබිඹු ගත චෙක්පත් භාවිතය තුළින් වාණිජ බැංකුවලට අත්වන ප්‍රතිලාභ කවරේද?

(ආ) අන්තර්ජාල බැංකුකරණය තුළින් ගනුදෙනුකරුවන්ට සපයන සේවා 2 ක් නම් කරන්න.

(iv) (අ) ජීවිත රක්ෂණය, දේපල රක්ෂණයෙන් වෙනස් වන්නේ කෙසේදැයි දක්වන්න.

(ආ) වාහනයක් මිලදීගත් නිමල්ට රක්ෂණය පිළිබඳ දැනුමක් නොමැත. වාහනය සම්බන්ධව ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග දක්වන්න.

(v) (අ) රක්ෂණ තැරැව්කරු හා රක්ෂණ නියෝජිතයා යනු කවුද? විමසන්න.

(ආ) රක්ෂණ වෙළඳපලේ ක්‍රියාත්මක පාර්ශව නම් කරන්න.

(4) (i) (අ) GPS තාක්ෂණය, ව්‍යාපාරවලට කොතරම් වැදගත් වේදැයි දක්වන්න.

(ආ) මහාමාර්ග ප්‍රවාහනයට සාපේක්ෂව, අධිවේගී මාර්ග ප්‍රවාහනයේ වාසි හා අවාසි දක්වන්න.

(ii) (අ) ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව පවත්වා ගැනීමට සන්නිවේදනය උපකාරී වන ආකාරය පහදන්න.

(ආ) වාචික සන්නිවේදනයට සාපේක්ෂව ලිඛිත සන්නිවේදනය වැදගත් වන්නේ කෙසේද? කවර අවස්ථාවලදීද?

(iii) (අ) වෙළඳපල තුළ කටයුතු කරන තොග වෙළඳුන් 4 ක් නම් කරන්න.

(ආ) තොග වෙළඳුන්ගෙන් නිෂ්පාදකයාට සැලසෙන සේවාවන් 4 ක් දක්වන්න.

(iv) (අ) තම නිෂ්පාදිතයක් විදේශ වෙළඳපළට අපනයනය කිරීමට බලාපොරොත්තු වන සහන්ට ඊට අදාළ අපනයන ක්‍රියාවලිය පිළිබඳව අදහසක් ලබා දෙන්න.

(ආ) දේශීය, විදේශීය වෙළඳපල දෙකම ජයගැනීමට වර්තමාන ව්‍යාපාරිකයන් ක්‍රියා කරන්නේ ඇයිදැයි දක්වන්න.

(v) (අ) අන්තර්ජාතික වෙළඳාමේ දියුණුවට පිහිටුවා ඇති කලාපීය වෙළඳ ගිවිසුම් 02 ක් හා සංවිධාන 2 ක් නම් කරන්න.

(ආ) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් 4 ක් සඳහන් කරන්න.

## 'ආ' කොටස

(5) (i) (අ) ව්‍යාපාරයක කළමනාකරුවන් ගනු ලබන තීරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සාධක 4 ක් දක්වන්න.

(ආ) කළමනාකරුවකු 'සහයෝගිතාව ගොඩනගන්නකුගේ කාර්යය' හා 'කතිකාකරන්නකුගේ කාර්යය' යනාදියේ නිරත වනු අප දැක ඇත්තෙමු. එහි අදහස උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ii) (අ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකරුවකු මුහුණපාන ගැටලු 04 ක් දක්වන්න.

(ආ) සැලසුම් සකස් කිරීමේදී සෑම මට්ටමකම කළමනාකරුවන් ඊට සහභාගී වීමෙන් අත්වන ප්‍රතිලාභ 04 ක් දක්වන්න.

(iii) (අ) ව්‍යාපාරයක දෙපාර්තමේන්තු ඇති කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මොනවාදැයි දක්වන්න.

(ආ) ව්‍යාපාරයක බලතල පැවරීමේදී සලකා බලන සාධක 04 ක් දක්වන්න.

(iv) (අ) ව්‍යාපාරයක තනතුරු දක්වමින් උස් පාලන ව්‍යුහයක් ඇඳ පෙන්වන්න.

(ආ) සාර්ථක නායකයකු යනු 'කාර්යය අභිමුඛ නායකත්වය හා සේවක අභිමුඛ නායකත්වය' යන අන්ත දෙකම ගමන් නොකර මධ්‍යස්ථාන ක්‍රියා කරන්නෙකි. මේ පිළිබඳ ඔබේ අදහස් පැහැදිලි කරන්න.

(v) (අ) ව්‍යාපාර ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැදගත් වන්නේ ඇයි දැයි දක්වන්න.

(ආ) ව්‍යාපාර කටයුතුවලදී ඉදිරිපෝෂණ පාලනය, පසුපෝෂණ පාලනයට වඩා වැදගත් වන්නේ ඇයිදැයි දක්වන්න.

(6) (i) (අ) නිෂ්පාදන ඉංජිනේරුකරණය තුළ සිදුවන්නාවූ ක්‍රියාවලින් (කාර්යයන්) 4 ක් දක්වන්න.

(ආ) ප්‍රවාහ නිෂ්පාදනයේදී, නිෂ්පාදන කළමනාකරු මුහුණ පෑමට සිදුවන අභියෝග 4 ක් දක්වන්න.

(ii) (අ) එහාමෙහා ගෙනයාමට අපහසු, මහා පරිමාණ ආයෝජන වශයෙන් නිෂ්පාදනය කරන නිෂ්පාදිත සඳහා වඩාත් සුදුසු වන නිෂ්පාදන පිරියත නම් කර, එකී පිරියත සැලැස්මක් යටතේ නිපදවන නිෂ්පාදිත 2කට උදාහරණ දෙන්න.

(ආ) අතිරික්ත තොගයක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයට මුහුණපෑමට සිදුවන අවාසිදායි තත්ත්වයන් 4 ක් දක්වන්න.

(iii) (අ) සිරි සමාගමේ උපුටාගත් තොරතුරු පහත වේ.

| | |
|---|---|
| උපරිම ද්‍රව්‍ය භාවිතය | 3000 |
| අවම ද්‍රව්‍ය භාවිතය | 1000 |
| සාමාන්‍ය ඇණවුම් කාලය | මාස 3 |
| යළි ඇණවුම් ප්‍රමාණය | 500 |

(1) යළි ඇණවුම් මට්ටම.

(2) උපරිම තොග මට්ටම ගණනය කරන්න.

(ආ) භාණ්ඩයේ ගුණත්වයට අයත් අංග 4 ක් දක්වන්න.

(iv) (අ) අලෙවි මිශ්‍රයේ විචල්‍යයක් වන ස්ථානය හෙවත් බෙදාහැරීමේ වැදගත්කම පහදන්න.

(ආ) වර්තමානයේ බොහෝ ව්‍යාපාර නිෂ්පාදන විවිධාංගීකරණ අනුගමනය කරයි. මේ උපක්‍රම තුළින් ව්‍යාපාර අපේක්ෂා 04 ක් දක්වන්න.

(v) (අ) අලෙවිකරණය, පාරිභෝගිකයාට හා ආර්ථිකයට වැදගත් වන ආකාර 2 බැගින් දක්වන්න.

(ආ) ව්‍යාපාරයක් තම නිෂ්පාදන ඉදිරිපත් කිරීමට ඉලක්ක තෝරා ගන්නේ ඇයි දැයි පහදන්න.

(7) (i) (අ) ව්‍යාපාරිකයා තම නිෂ්පාදිතයේ සන්නම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට හේතු 4 ක් දක්වන්න.

(ආ) නිෂ්පාදිතයාට මිලක් තීරණය කිරීමේ පරමාර්ථ 4 ක් දක්වන්න.

(ii) (අ) විකුණුම් ප්‍රවර්ධන ක්‍රම 4 ක් හා ඍජු අලෙවිකරණ ක්‍රම 4 ක් දක්වන්න.

(ආ) අලෙවි කළමනාකරු තම නිෂ්පාදනය ප්‍රචාරණය කිරීම තුළින් ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු 4 ක් දක්වන්න.

(iii) (අ) මූල්‍ය කළමනාකරු තම ව්‍යාපාරයට මූල්‍ය සම්පාදනය කරගන්නා ඍජු මාර්ග හා වක්‍ර මාර්ග 4 බැගින් දක්වන්න.

(ආ) ආයෝජන තීරණයක් ගැනීමේදී සලකා බලන මූලික කරුණු 4 ක් දක්වන්න.

(iv) (අ) කොටස් වෙළඳපලේ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයකුට කොටස් තැරැව්කාර සමාගම් සහය වන්නේ කෙසේදැයි පහදන්න.

(ආ) පහත ඒවා කෙටියෙන් හඳුන්වන්න.

- සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.
- අන්තර්බැංකු ඒක්ෂණ ණය වෙළඳපල.

(v) (අ) රැකියා නිර්මාණය යනු කුමක්ද?

රැකියා නිර්මාණයේදී භාවිතා කරන උපක්‍රම 2 ක් වූ රැකියා විස්තාරණය හා රැකියා පෝෂණය කෙටියෙන් හඳුන්වන්න.

(ආ) ව්‍යාපාරයක සේවක හිඟයක් පැන නැගුණ විට ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් දක්වන්න.

(8) (i) (අ) ව්‍යාපාරයක් මිනිස් බල සැලසුම් කිරීමේ අරමුණු 4 ක් දක්වන්න.

(ආ) ව්‍යාපාර ආයතනයකට සේවක ආකර්ෂණය කරගත හැකි අභ්‍යන්තර හා බාහිර ක්‍රම 2 බැගින් දක්වන්න.

(ii) (අ) අන්තර්ජාලයෙන් සැපයෙන සේවා 4 ක් දක්වන්න.

(ආ) ව්‍යාපාර ආයතනයකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ 04 ක් දක්වන්න.

(iii) (අ) පරිගණක ජාලයක පරිගණක සම්බන්ධ කර ඇති ආකාර අනුව ජාල වර්ග 4 ක් දක්වන්න.

(ආ) පහත ඒවා කෙටියෙන් හඳුන්වන්න.

(1) තොරතුරු පද්ධතිය

(2) දත්ත

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක ඇතුළත් අංග 4 ක් නම් කරන්න.

(ආ) ව්‍යාපාර සැලැස්මක් තුළින් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන පාර්ශව 4 ක් නම් කරන්න.

(v) (අ) ව්‍යාපාර සැලැස්මක මෙහෙයුම් සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු කරුණු 4 ක් නම් කරන්න.

(ආ) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශයක ඇතුළත් කරුණු 04 ක් නම් කරන්න.